# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

**අංක 1949/12 - 2016 ජනවාරි මස 11 වැනි සඳුදා - 2016.01.11**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 268 වන වගන්තිය යටතේ පළ කරනු ලබන නිවේදනය**

252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 272(32) උප වගන්තියේ විධිවිධාන අනුව මීගමුව මහා නගර සභාව විසින් සාදනු ලදුව 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 268 වගන්තිය යටතේ බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය හා පළාත් පාලන විෂයභාර අමාත්‍යතුමා විසින් අනුමත කර අංක 1622/21 හා 2009.10.07 දතමින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කළ මීගමුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ පෞද්ගලික පොළවල් විධිමත් කිරීම, පාලනය කිරීම, පරිපාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, මීගමුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ මහා නගර සභාව මගින් පාලනය වන වීථිවල විවිධ රාජ්‍ය/අර්ධ රාජ්‍ය/සංස්ථා/මණ්ඩල/සමාගම් හා පුද්ගලයින් විසින් ජලනළ එළීම හා භූගත රැහැන් ඇදීම පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව සහ මීගමුව මහා නගර සභා බල ප්‍රදේශය තුළ මහා නගර සභාව මගින් පාලනය වන වීථිවල විවිධ රාජ්‍ය/අර්ධ රාජ්‍ය/සංස්ථා/මණ්ඩල/සමාගම් හා පුද්ගලයින් විසින් ඉදිකරනු ලබන කණු හා ස්ථම්භ සවි කිරීමේ කාර්යය පාලනය කිරීම හා ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 252 අධිකාරය වන මහා නගර සභා ආඥාපනතේ 268 වන වගන්තියේ වැඩිදුරටත් සඳහන් විධිවිධාන අනුව 2015 සැප්තැම්බර් 22 වන දින බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් අනුමත කළ බව මෙයින් නිවේදනය කරමි.

ඉසුර දේවප්‍රිය,
බස්නාහිර පළාතේ, ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා
ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත්
පාලන හා පළාත් පරිපාලන, ආර්ථික සංවර්ධන, විදුලිබල හා
බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවහන සහ
සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍ය.

2016 ජනවාරි මස 05 වැනි දින,
කොළඹ 07, ශ්‍රාවස්ථි මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ, ප්‍රධාන අමාත්‍යාංශයේ දී.

01- 930


1A - PG 2781 — 10 (2016/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*